# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 160/46 — 1975 අප්‍රේල් 19 වැනි සෙනසුරාදා — 1975.04.19

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

ජනා. කා. අංකය : ඩබ්ලිව්. 68(50)/75.

**මහාජන ආරක්ෂක ආඥාපනත (40 වන අධිකාරය)**

අගමැතිගේ නිර්දේශය අනුව (40 වන අධිකාරය වූ) මහාජන ආරක්ෂක ආඥාපනතේ 5 වන වගන්තිය යටතේ ජනාධිපති වරයා විසින් සාදනු ලැබූ නියෝගය.

වි. ගොපල්ලව,
ජනාධිපතිවරයා.

1975 අප්‍රේල් මස 19 වැනි දින,
නුවරඑළිය,
ජනාධිපති කාර්යාලයේදී ය.

**නියෝගය**

වෙන යම් ලිඛිත නීතියක කුමක් සඳහන්ව ඇත ද, මෙහි වූ උපලේඛනයෙහි I වන තීරයේ නිශ්චිතව සඳහන් එක් එක් සුළු නගර සභාවේ කටයුතු පිළිබඳ පරිපාලනය, එකී උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහනේ සඳහන් එක් එක් පුද්ගලයා වෙත, මෙම නියෝග බලපවත්වන තාක් හා ඒ තාක් පමණක් 1975 ජනවාරි මස 1 වන දින සිට පැවරෙන්නේය ; තවද ඒ අනුව ඒ එක් එක් සුළු නගර සභාවේ කටයුතු පිළිබඳ පරිපාලනය පැවරී ඇති එක් එක් පුද්ගලයා විසින් ඉහත කී කාලසීමාව තුළ සුළු නගර සභා ආඥා පනත මගින් හෝ වෙන යම් ලිඛිත නීතියක් මගින් සුළු නගර සභාවක් සහ එහි සභාපති වෙත පවරා ඇති බලතල පාවිච්චි කිරීම හා නියම කර ඇති යුතුකම් ඉටු කිරීම කළ යුතුය.

උපලේඛනය

| I තීරය | II තීරය |
|---|---|
| දන්කොටුව සුළු නගර සභාව ... | ... වර්සහැන්නැදිගේ මර්වින් ජෝශප් ඇන්තනි ප්‍රනාන්දු |
| වෙන්නප්පුව සුළු නගර සභාව ... | ... නොයෙල් කිංස්ලි දිසානායක |
| මහරගම සුළු නගර සභාව ... | ... දෙන් ඩයනීසියස් හේමචන්ද්‍ර සූරියආරච්චි |
| ඇල්පිටිය සුළු නගර සභාව ... | ... ජස්ටින් දයාසේන කැප්පෙටියාගම |


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

121A——ඒ 13672—2,100 (75/04)